**හබරාදූව ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 08 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට හබරාදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දී ප්‍රධාන කාර්යාලය නවීකරණය සඳහා වැයකළ රු.439,800 ක් හා කොග්ගල ආදාහනාගාරයේ සනීපාරක්ෂක වැසිකිළි පද්ධතිය ඉදිකිරීම සඳහා වැයකල රු.1,558,745 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ඉදිකර, සභාවට භාර දී තිබූ කොග්ගල සිරිමාවෝ බණ්ඩාරනායක රංග ශාලාව හා අහංගම පොදු වෙළඳ සංකීර්ණයට අයත් ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය තුළදී පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු ලීටර් 2,000 ක ජල ටැංකි 02 ක වටිනාකම තක්සේරු කර, ගිණුම් ගතකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී සභාව මිලදී ගෙන තිබුණු රු.130,000 ක් වූ ලීටර් 65, කොම්පෝස්ට් බඳුන් 04 ක වටිනාකම ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.5,919,081 ක් ණයහිමියෝ ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණු ණය ගෙවා අවසන් වුවද, රු.304,869 ක ගෙවිය යුතු ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) 2017 වර්ෂය තුළ වෙන්දේසි කර තිබූ විකුණුම් වටිනාකම රු.491,430 ක් වූ භාණ්ඩ ඒකක 41 ක ගත් මිල ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් ගිණුම් ගතකර නොතිබුණි.

(ඒ) අහංගම නව වෙළඳ සංකීර්ණයේ පොදු වෙළඳපොල කඩ කාමර වෙනුවෙන් ලැබිය යුතු එක්වන් මුදල් රු.11,550,000 ක් හා කඩ කාමර කුලී හා දඩ ගාස්තු රු.264,600 ක් ගිණුම් ගතකර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

---------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.132,564,922 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම්වල එකතුව රු.101,019,120 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

--------------------

2008 වර්ෂයේ සිට ඉදිරියට ගෙනෙමින් පවතින රු.601,430 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

**(අ) ලැබිය යුතු ගිණුම්**

--------------------

වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.1,827,260 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 05 ක් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

---------------------

2008 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු.1,410,752 ක් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු රු.1,480,426 ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

-------------------------------------------------

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

-------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.147,621,562 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|
| | රු. | |
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | |
| (i) රීති 33 | - | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 145 | - | ආපසු ගෙවිය යුතු තැන්පත් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයන් සකස් කර ලෙජරයේ දැක්වෙන ශේෂය සමඟ ගැලපීම් කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | |
| (i) මුදල් රෙගුලාසි 395(ඇ) | - | සභාවේ පොදු බැංකු ගිණුමේ 2017 ජූලි සිට 2018 අප්‍රේල් දක්වා බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | 1,922,347 | වර්ෂ 02 ක කාලයක් ඉක්මවා තිබුණු තැන්පතු ශේෂ 90 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | - | සභාව සතු ධාවන තත්ත්වයේ ඇති වාහන 12 ක දෛනික ධාවන සටහන් හෝ මාසික කාර්යසාධන සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන භාණ්ඩාගාර ලේකම්ගේ හා මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | - | සභාව සතු වාහන 09 ක් සම්බන්ධයෙන් අපහරණය කිරීමට හෝ සුදුසු වෙනත් විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 2010 අගෝස්තු 17 දිනැති අංක : PE/01/01 දරන විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශ චක්‍රලේඛය | - | සමාලෝචිත වර්ෂයේ දී සවි කරන ලද විදුලි පහන් වෙනුවෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු 223,262 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,913,388 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

---------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මුදල් භාර ගැනීම හා ආරක්ෂා සහිතව ආරක්ෂිත සේප්පුවේ තැන්පත් කර දෛනිකව බැංකුගත කිරීම, උප පත්‍රිකා ලේඛන පවත්වාගෙන යාම හා ඊට අදාළ උප පත්‍රිකා ආරක්ෂා සහිතව ක්‍රමානුකූලව ගබඩා කර තබා ගැනීම හා බැංකු සැසඳුම් පිළියෙල කිරීම යන කාර්යයන් එකම නිලධාරියෙකුට පවරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පොදු ගිණුමට අදාළව අවසන් වරට පිළියෙල කරන ලද බැංකු සැසඳුමේ සඳහන් වන රු.533,798 ක් වූ හඳුනා නොගත් බැර ශේෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

---------------------

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

---------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 3,814,100 | 3,705,913 | 3,392,765 | 7,319,814 | 7,437,265 | 5,088,103 | 18,553,860 | 7,006,666 |
| ii. | කුලී | 4,829,200 | 5,078,693 | 4,975,685 | 155,027 | 51,350,250 | 4,402,135 | 4,530,000 | 52,019 |
| iii. | බලපත්‍ර ගාස්තු | 5,073,250 | 6,374,386 | 6,353,986 | 51,000 | 4,702,150 | 3,854,912 | 3,866,062 | 30,600 |
| iv. | වෙනත් ආදායම් | 63,808,450 | 15,832,955 | 16,327,637 | 29,048,021 | 52,541,650 | 16,323,436 | 20,160,085 | 29,542,703 |
| | | 77,525,000 | 30,991,947 | 31,050,073 | 36,573,862 | 116,031,315 | 29,668,586 | 47,110,007 | 36,631,988 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.77,525,000 ක් ද, බිල්කළ ආදායම රු.30,991,947 ද, වර්ෂය තුළ රැස් කළ ආදායම රු.31,050,073 ක් ද වූ අතර, හිඟ ආදායම රු.36,573,862 ක් විය.

### 2.3.3 වරිපනම් හා බදු

සමාලෝචිත වර්ෂයේ බිල් කළ ආදායම හා වර්ෂය ආරම්භයේ තිබූ හිඟ ශේෂය සමග රු.10,712,579 ක් වූ රැස් කළයුතු ආදායමින් රැස් කළ ආදායම රු.3,392,765 ක් වූ බැවින්, වර්ෂය අවසානයට වූ හිඟ ශේෂය රු.7,319,814 ක් විය.

### 2.3.4 කුලී

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.4,829,200 ක් හා බිල් කළ ආදායම රු.5,078,693 ක් වූ අතර, ඇස්තමේන්තුගත ආදායමින් බිල් කළ ආදායම සියයට 105 ක් විය. වර්ෂය අවසානයට හිඟ ශේෂය රු.155,027 ක් විය.

### 2.3.5 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු.5,073,250 ක් වූ අතර, බිල් කළ ආදායම රු.6,374,386 ක් විය. වර්ෂ අවසානයට තවදුරටත් අයකළ යුතු හිඟ ශේෂය රු.51,000 ක් විය.

### 2.3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.14,642,995 ක් හා උසාවි දඩ රු.5,158,832 ක් ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කාර්යසාධනය

---------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2007 ජනවාරි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා වූ දස අවුරුදු කාලයට සභාව විසින් එළුකැටිය බිම්බාරාම විහාරස්ථානයට අයත් ඉඩමක් බිම් බද්දට ගෙන කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් අරඹා තිබුණි. ප්‍රදේශවාසීන්ගේ විරෝධය නිසා 2015 දෙසැම්බර් 02 දින සිට එම භූමියේ කසළ කළමනාකරණ කටයුතු සිදුකොට නොතිබුණි. රු.750,000 ක් වටිනා යන්ත්‍ර උපකරණ භාවිතයට නොගෙන අහංගම උප කාර්යාලයේ තබා තිබුණි.

(ii) අංක PL/1/15/12 දරන පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ කසළ කළමනාකරණ පිළිබඳ මාර්ගෝපදේශය ප්‍රකාර කසළ කළමනාකරණය සම්බන්ධයෙන් දීර්ඝකාලීන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය වනවිට කසළ බැහැර කිරීමට නිශ්චිත ස්ථානයක් නොවූ අතර, තාවකාලිකව හබරාදූව ලියනගොඩ විහාරස්ථානයට අයත් ඉඩමක හිරිගල් හාරා අතහැර දමන ලද වලවල් වලට කසළ බැහැර කර, පස් දමා වැසීම සිදු කරමින් පැවතුණි. ජලය පිරී පවතින වලවල් වලට කසළ බැහැර කිරීම හේතුවෙන් එම ස්ථානයෙන් අධික දූර්ගන්ධයක් වහනය වූ අතර, එම ඉඩම මායිමේ පැවති ප්‍රාථමික විද්‍යාලයේ සිසුන්ගේ හා අසල නිවැසියන්ගේ සෞඛ්‍ය කෙරේ අවදානමක් පැවතුණි

(iv) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ ගෘහාශ්‍රිත හා රජයේ ආයතනවල අපද්‍රව්‍ය තේරීමේ ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීම සඳහා කසළ වෙන් කිරීමේ බඳුන් කට්ටල 79 ක් නොමිලයේ බෙදා හැරීමට සභාවට ලබා දී තිබූ අතර, ඉන් කට්ටල 75 ක් හා ඉහත ප්‍රතිපාදන යටතේම සහන මිලට අලෙවි කිරීමට ලබාදුන් කොම්පෝස්ට් බඳුන් 250 කින් බඳුන් 208 ක් 2018 අප්‍රේල් වනවිටත් බෙදා දීමට කටයුතු නොකොට ගබඩාවේ තිබුණි. මේ හේතුවෙන් ඉහත ව්‍යාපෘතිවලින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) **තිරසර සංවර්ධන ඉලක්ක**

**-----------------------------**

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ට්‍රැක්ටර් 02 ක් හා කැබ් රථයක් වර්ෂ 20 ක කාලයක් තිස්සේ අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ පවත්වා ගතයුතු හිඟ ආදායම් වාර්තාව, දේශීය ණය ලේඛනය, ණයගැති ලේඛනය, ප්‍රා.ස. 07 වාර්තාව සහ හානි හා පාඩු ලේඛනය පවත්වාගෙන නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සේවක සංඛ්‍යා සැලැස්ම අනුව අතිරික්ත සේවක සංඛ්‍යාව 16 ක් වූ අතර, පුරප්පාඩු සංඛ්‍යාව 20 ක් විය. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමටත්, පුරප්පාඩු සඳහා බඳවා ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 ට අනුකූල නොවන පරිදි බඳවාගත් ආදේශක සේවකයින් 09 දෙනෙකුට වැටුප් හා දීමනා ගෙවීම සඳහා 2017 වර්ෂය තුළදී සභා අරමුදලින් රු.2,966,780 ක් වැයකර තිබුණි.

(ඇ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරක් නොවන විදුලි කම්කරු තනතුර සඳහා 2014 ඔක්තෝබර් 24 දින සේවකයන් දෙදෙනෙකු බඳවා ගෙන 2017 දෙසැම්බර් 31 දින දක්වා රු.772,272 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

අහංගම උප කාර්යාලයට අයත් නව වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ කඩ කාමරයක් බදු දීමට කටයුතු කර නොතිබුණි

## 3.5 වත්කම් කළමනාකරණය

---------------------------

### 3.5.1 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

**-----------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂයේ සිට අක්‍රීයව පැවති ජල බවුසරය, අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු නොකර, අහංගම උප කාර්යාල අංගනයේ ගාල්කර තිබුණි.

(ආ) සභාවේ ට්‍රැක්ටර් ටේලර් 03 ක් අක්‍රීයව සභාවේ හා උප කාර්යාලවල ගාල්කර තිබුණි.

(ඇ) 2013 වර්ෂයේ සිට භාවිතයට ගැනීමට කටයුතු නොකළ සිමෙන්ති මිශ්‍රණ යන්ත්‍රයක් අහංගම උප කාර්යාල පරිශ්‍රය තුළ තිබුණු අතර මෙම යන්ත්‍රය පිළිබඳ තොරතුරු කිසිවක් සභාව සතුව නොතිබුණි.

**3.5.2 අයිතිය පවරා නොගත් වත්කම්**

සභාව විසින් පරිහරණය කරන වාහන 04 ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 07 ක එකතුව රු.23,353,773 ක් වූ ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, වියදම් විෂයයන් 02 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.698,550 ක් විය.

(ඇ) ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.48,083,884 ක් වූ අතර, එම වටිනාකම සියයට 03 සිට සියයට 46 අතර පරාසයක විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01/නා.ච.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව සභාව සඳහා අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ) | සේවක මණ්ඩල | (i) | පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම. |

| | | | |
|---|---|---|---|
| | කළමනාකරණය | | |
| | | (ii) | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර නොගැනීම. |
| | | (ii) | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට දේපල තහනම් කිරීමේ නිලධාරීන් පත්කර නොතිබුණි. |
| | | (iii) | කසළ බදු අය කරගෙන නොතිබුණි. |
| (ඇ) | කළමනාකරණ අකාර්යක්ෂමතා | (i) | බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි. |
| | | (ii) | පවත්වා ගතයුතු ලේඛන පවත්වා නොතිබුණි. |
| (ඉ) | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් සභාව සතුව නොතිබුණි. |
| | | (ii) | කසළ බඳුන් බෙදා දීමට කටයුතු කර නොතිබුණි. |